# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,103 — 1935ක්වූ පෙබරවාරි මස 8 වෙනි දිනවූ සිකුරාද.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### උපාංග නීති.

**1920සේ අංක 1 දරන අධ්‍යාපන ආඥාපණත.**

රත්නපුරේ ආදායම් දිස්ත්‍රික්කයේ අධ්‍යාපන දිස්ත්‍රික් කාර්‍ය සභාව විසින් 1920සේ අංක 1 දරන අධ්‍යාපන ආඥාපණතේ 25 (1) වෙනි වගන්තිය යටතේ සම්පාදිතව අධ්‍යාපන සභාව විසින් මැනවැයි පිළිගන්නාලදින් ආණ්ඩුකාරතුමාණන් විසින් උත්වහන්සේ කෙරෙහි ආඥාපණතෙහි 25 (5) වෙනි වගන්තියෙන් හා 1931සේ ලංකා (රාජ්‍යසභා) රාජසභාවේ නියෝගයේ 93 වෙනි වගන්තියෙන් පැවරී තිබෙන බලයේ ප්‍රකාර ස්ථිර කරනලද උපනීති.

සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර,
අධ්‍යාපන අමාත්‍ය තැන.

වර්ෂ 1935ක්වූ පෙබරවාරි මස [illegible] වෙනි දින කොළඹ අධ්‍යාපන අමාත්‍යතුමාගේ කාර්‍යාලයේදීය.

### උපනීති.

1. (1) යම් රැස්වීමක් පැවැත්වීමට නියමකර තිබෙන දිනට සතියකට අඩුනැති කාලයකට කලින් ප්‍රධානතුමා විසින් ඒ රැස්වීම පැවැත්වීමට තරම් සෑහෙන කටයුතු නැති බැවින් එය පවත්වන්නේ නැතැයි කියා හෝ තම දැන්වීමෙහි නියමිත වෙනයම් දිනක එය පවත්වන්නේයයි කියා හෝ ලියවිල්ලකින් දැනුම්දුනහොත් මිස නැත්නම් කාර්‍යසභාවේ සාමාන්‍ය රැස්වීම් පෙබරවාරි, අප්‍රේල්, ජූනි, අගෝස්තු, ඔක්තෝබර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේ තුන්වෙනිවරට යෙදෙන සඳුදා දිනවල පැවැත්විය යුතුයි.

(2) ප්‍රධානතුමාට විශේෂ රැස්වීමක් පැවැත්වීමට වුවමනාවූ විට ඒ රැස්වීමේදී කිරීමට අදහස්කරන වැඩවල ස්වභාවය දක්වා ඔහු විසින් ඒ රැස්වීම පැවැත්වීමට නියමකරන දිනට සතියකට අඩුනැති කාලයකට කලින් ලියවිල්ලකින් දැනුම් දීමෙන් එසේ කළ හැකියි.

(3) ප්‍රධානතුමා විසින් එක් එක් රැස්වීමෙහි තොරතුරු ඒ රැස්වීම පවත්වන පිළිවෙළටම වාර්තා පොතක සටහන් කොට සෑම රැස්වීමකම තොරතුරුවල පිටපතක් ඒ රැස්වීමට පසු හැකි තරම් ඉක්මනින් එක් එක් සාමාජිකයා වෙත යවන්ට සැලැස්විය යුතුයි.

2. (1) මීට යාකොට තිබෙන A උප ලේඛනයෙහි දක්වා තිබෙන ප්‍රදේශ, අධ්‍යාපන මණ්ඩලය විසින් පිළිගත් පාඨශාලා මගින් මූලික අධ්‍යාපනයක් ලබාදීම පිණිස හොඳින් විධිවිධාන සලස්වා ඇති ප්‍රදේශ හැටියට මෙයින් ප්‍රකාශකරනු ලැබේ.

(2) මේ උපනීතිවල "පාඨශාලාව" යනුවෙන් අධ්‍යාපන මණ්ඩලය විසින් දැනටමත් පිළිගෙන තිබෙන්නාවූ හෝ මින්පසු පිළිගන්නාවූ මේ දිස්ත්‍රික්කය ඇතුළත තිබෙන පාඨශාලාවලින් කොයියම් එකක්වුවත් අදහස්කරනු ලැබේ.

3. මේ අධ්‍යාපන දිස්ත්‍රික්කය තුළ—

(*a*) වයස අවුරුදු 6කට අඩුනුවූ හෝ 14කට වැඩිනුවූ සෑම පිරිමි ළමයාගේ මව හෝ පියාද,

(*b*) වයස අවුරුදු 6කට අඩුනුවූ හෝ 12කට වැඩිනුවූ සෑම ගැනු ළමයාගේ මව හෝ පියාද,

ඒ පිරිමි ළමයාගේ හෝ ගැනු ළමයාගේ ඉගෙනීම සඳහා තමා විසින් වෙන සෑහෙන විධිවිධාන සලසා හෝ අසරණකම හෝ අසනීපකම නිසා ඒ පිරිමි ළමයා හෝ ගැනු ළමයා කාර්‍යසභාවේ ප්‍රධානතුමා විසින් පාඨශාලාවට පැමිණීමෙන් නිදහස් කර හෝ තිබේනම් මිස නැත්නම් ඒ පිරිමි ළමයාට හෝ ගැනු ළමයාට පාඨශාලාවට පැමිණීමට සැලැස්විය යුතුයි.

එහෙත්—

(*a*) වයස අවුරුදු 10යෙන් ඉහළ මුස්ලිම් හා දෙමළ ගැනු ළමයින්ට ; හෝ

(*b*) ව්‍යවස්ථා පොතේ 4 වෙනි ප්‍රමාණයට නියමිතවූ විභාගයෙන් කියවීම, ලිවීම, ගණිතය, යන මේ කරුණුවලින් සමත්වූ බවට අධ්‍යාපන මණ්ඩලයේ පරීක්ෂක නිලධාරියකුගෙන් සහතික පත්‍රයක් දරන්නාවූ හා ප්‍රධානතුමා විසින් මැනවැයි පිළිගනුලබන විධියේ ප්‍රයෝජනවත් කටයුත්තක යෙදීසිටින්නාවූද වයස අවුරුදු 14ටෙන් පහළ ඕනෑම පිරිමි ළමයකුට හෝ අවුරුදු 12ගෙන් පහළ ඕනෑම ගැනු ළමයකුට ; හෝ

(*c*) වයස අවුරුදු 8ටෙන් පහළ ඕනෑම පිරිමි ළමයකුට හෝ තම ගෙදර හෝ පදිංචි ස්ථානය දුරින් සැතැප්මකට වැඩිවූ ඕනෑම ගැනුළමයකුට හෝ වයස අවුරුදු 8ටෙන් ඉහළවූද, ඕනෑම පාඨශාලාවක සිට ඉතාම කොට පාරෙන් තම ගෙදරට හෝ පදිංචි ස්ථානයට දුරින් සැතැප්ම දෙකකට වැඩිවූද ඕනෑම පිරිමි ළමයකුට,

එසේ පාඨශාලාවට පැමිණීමට බලනොකළ යුතුයි.

4. (1) මේ උපනීතිවලදී කවර ළමයකුගේ වුවත් දිනපතා පාඨශාලාවට පැමිණ සිටීමේ කාලය ඒ සමාන වයස්වල ළමයින්ගේ ඉගෙනීම සඳහා පාඨශාලාව දිනපතා පවත්වන සම්පූර්ණකාලය විය යුතුයි; එහෙත් ආඥාපණතේ 15 (2) වෙනි වගන්තියේ ප්‍රකාර ආගම ඉගැන්වීම කෙරෙන කාලයතුළ කවර ළමයකු වුවත් නොපැමිණ සිටීම වරදක් මෙන් ගණන් නොගත යුතුයි.

5. මේ උපනීතිවල විධිවිධාන නොපිළිපදින්නාවූ කවර පියකු හෝ මවකු වුවත් රු. 5කට වැඩි නොවූ දඩයක්ද ඒ වරද ඉදිරියටත් කරගෙන යන්නේනම් එසේකරන දෙවෙනි දවසට හා ඉන්පසු එක්එක් දවසට රු. 1කට වැඩි නොවන්නාවූ දඩයක්ද නියමකළ හැකි වරදක් කළාහම් වේ.

6. පහත පෙනෙන උපනීති මෙයින් අවලංගු කරනු ලැබේ:—

රත්නපුරේ ආදායම් දිස්ත්‍රික්කයේ අධ්‍යාපන දිස්ත්‍රික් කාර්‍ය්‍ය සභාව විසින් 1927 ඔක්තෝබර් මස 29 වෙනි දින සම්පාදිතව අංක 7,518 හා 1926 මාර්තු මස 26 වෙනි දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරණලද උපනීති.

අංක 7,741 හා 1929 ඔක්තෝබර් මස 18 වෙනි දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සංශෝධිතව පළකරණලද එකී උපනීතිවල 7 වෙනි උපනීතිය.

A. උපලේඛනය.

ඉහතින් දැක්වූ උපනීතිවල සඳහන්වන ප්‍රදේශවල විස්තර.

| | | |
|---|---|---|
| 1. | උඩපත්තුව .. | කුරුවිටිකෝරළය |
| 2. | මැදපත්තුව .. | |
| 3. | පල්ලේපත්තුව .. | |
| 4. | උඩපත්තුව .. | නවදුන්කෝරළය |
| 5. | මැදපත්තුව .. | |
| 6. | පල්ලේපත්තුව .. | |
| 7. | උඩපත්තුව .. | කුකුල්කෝරළය |
| 8. | මැදපත්තුව .. | |
| 9. | පල්ලේපත්තුව .. | |
| 10. | පන්නිල්පත්තුව .. | අටකලන්කෝරළය |
| 11. | මැදපත්තුව .. | |
| 12. | කඳවැල්පත්තුව හා නබගම්පත්තුව .. | |
| 13. | කොළොන්නාගම්පත්තුව .. | කොළොන්නාකෝරළය |
| 14. | දියපොතගම්පත්තුව .. | |
| 15. | හෙලඋඩපළාත .. | මැදකෝරළය |
| 16. | හෙලපල්ලේපළාත .. | |
| 17. | තලපිටගම්පත්තුව .. | කඩවත්කෝරළය |
| 18. | උඹුවග්ගම්පත්තුව .. | |

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3 නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—උඹුවාවල අභිනව මිශ්‍ර සිංහල පාඨශාලා ගෘහයක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 175. ගම—මධ්‍යම දිසාවේ මහනුවර හාරිස්පත්තුවේ කුලුගම්මනසිය පත්තුවේ උඹුවාවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බෝගහකොටුවේවත්ත | අවුරුදු 35 පමණ ඇති පොල්ගස් 16ද, අවුරුදු 10–20 පමණවූ සපුගස් එකක්, කොකෝගස් 2ක් ජම්බුගස් එකක් සහ පුවක්ගස් 35ක්ද, පොල්අතුවසනලද තාවකාලික පාඨශාලා ගෘහයක් සහ පොල්අතුවසනලද තාවකාලික කක්කුස්සියක්ද ඇතුලුවත්ත | උඹුවාවල පන්සල් වසී සුමණ ස්ථවිර | 0 3 22·2 |
| 2 | එම .. | අවුරුදු 5 පමණ ඇති පොල්ගස් 1 අවුරුදු 5–10 පුවක්ගස් 32, අවුරුදු 5–25 කොස්ගස් 15, අවුරුදු 5–15 කොකෝගස් 42 සහ පොල් අතු සෙවිලිකරණලද තාවකාලික පැලක්ද ඇතුලුවත්ත | එම සහ වඩුවල, (1) වියන්නා ලැගෙදර හීන්බබා, (2) එම ගුනයා විසින්ද අයිතිවාසිකම් කියනු ලැබෙක් | 0 0 24·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇතතාවූ හැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ මාර්තු මස 9 වෙනි දින උදේ 10 යේ කනිසමට උඹුවාවල පාඨශාලාවේදී මා ඉදිරියටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ ජනවාරි මස 31 වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

බී. සී. ආර්. ගුණවර්ධන,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3 නේ ආඥාපත්‍රයේ 7 වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—සම්මන්තුරේ ගැනු පාඨශාලාවක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 185. ගම—නො. 3 දරණ සම්මන්තුරේ කොඨාසය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පනයිඅඩිවලවු (වරිපනම් නො. 126, 126A, 127B හා 127C) | එළිමුඩුබිම .. .. | සම්මන්තුරේ 3 වෙනි කොඨාසයේ ඒ. යූ. වී. වී. ආදම්ලෙබ්බෙ, ඈම්. ආදම් ලෙබ්බෙ | 0 0 27·3 |
| 2 | කොරන්ඩාඩිවලවු (වරිපනම් නො. 132) | වත්ත, තාවකාලික මඩුවක්ද, අවුරුදු 8ක් පමණ වයසැති පොල්ගහක්ද, මුලත්වැල් 2කක්ද තිබේ | සම්මන්තුරේ නො. 3 දරණ කොඨාසයේ පකීර් මොහයදීන් සින්න ආලියා | 0 0 8 8 |
| 3 | පනයිඅඩිවලවු (වරිපනම් නො. 133) | වත්ත, තාවකාලික මඩු 2ක්ද, අවුරුදු 10 සිට 30 දක්වා වයසැති පොල්ගස් 1ක්ද, තල්ගස් 2ක්ද තිබේ | සම්මන්තුරේ 3 වෙනි කොඨාසයේ මීර ලෙබ්බෙ පෝඩි මොහමදු ඉස්මායිල් මරික්කාර් | 0 0 19·7 |
| 4 | පූවරසඩියාඩිවලවු (වරිපනම් නො. 125) | එළිමුඩුබිම .. .. | සම්මන්තුරේ 3 වෙනි කොඨාසයේ ඉස්මායිල් ලෙබ්බෙ, සුලයිමා ලෙබ්බෙ | 0 0 11 |
| 5 | පූවරසසියාඩිවලවු (වරිපනම් නො. 124) | වත්ත, තාවකාලික මඩුවක් හා අවුරුදු 4ක් වයසැති පොල්ගසක්ද තිබේ | සම්මන්තුරේ 3 වෙනි කොඨාසයේ අසනාර් ජයිනාම්බු | 0 0 9 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ මාර්තු මස 13 වෙනි දින පස්වරු 3 කනිසමට සම්මන්තුර වන්නියාගේ කන්තෝරුවේදී මා ඉදිරියටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇතතාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ ජනවාරි මස 31 වෙනි දින
මඩකලපුව කච්චේරියේදීය.

සී. සිත්තම්පලම්,
මඩකලපුවේ ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අක්කරපත්තුවේ පනන්කාඩුවේ පාඨශාලාවක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාර යට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 186. ගම—පනන්කාඩු.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පුල්ලයාර්කෝවිල්වලවු වත්ත (කඩාවැටියිය) | කෝවිලක් තිබේ අවුරුදු 25ක් පමණ වයසැති පොල් ගහක් සහ වම්මිගහක් තිබේ | පනන්කාඩුවේ පුල්ලයාර් කෝවිලේ භාරකාරයෝ | 0 1 22·7 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ මාර්තු මස 14වෙනි දින පස්වරු 3 කතිසමට අක්කරපත්තුවේ ගම්සභා උසාවියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ ජනවාරි මස 31වෙනි දින
මඩකලපුකච්චේරියේදීය.

සී. සින්නම්පලම්,
මඩකලපුවේ ආණ්ඩුවේ උප ඒජන්ත වර්ය.

---

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීමයි.

1935යේ නො. 1, පුත්තලම් දිස්ත්‍රික්කය. (මධ්‍යම පඩික්කීයේ ලාඩිකිකයන් සඳහායි.)

මෙහි පහත විස්තර සඳහන්වන ඉඩම් ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් ඒ ඉල්ලුම්පත්‍ර ලැබුනාට පසු දැනුම්දෙනුලබන ඉඩම් කච්චේරියකදී පරීක්ෂාකොට කල්පනාවට ගන්නා බව මෙයින් දැනුම්දෙනු ලැබේ. ඉහතකී ඉඩම් සම්බන්ධ වැඩි විස්තර කරුණු පුත්තලමේ කච්චේරියෙන්ද, කුරුණෑගල මිනින්දෝරු කන්තෝරුවෙන් හෝ කොළඹ සර්වෙයර් ජනරල් කන්තෝරුවෙන්ද ඒ ඒ කන්තෝරුවල වැඩකරන කාලය තුළදී විභාගකර දැනගත හැකියි.

2. ඉල්ලුම්කරන්නට කැමති අය විසින් ඔවුන් ඉල්ලුම්කරන්නට අදහස්කරන ඉඩමේ ප්‍රමාණය හා ඉඩම ලැබුනොත් එහි දූම්මට අදහස්කරන වැවිලිද සඳහන්කොට ඒ සම්බන්ධ ඉල්ලුම්පත්‍ර ලියා 1935යේ මාර්තු මස 15වෙනි දින හෝ ඊට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමා වෙත යැවිය යුතුයි. ඉල්ලුම්පත්‍රය සමග මුදලක් බැඳීම වුවමනා නැත. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම්පත්‍ර පිළිබඳ වැඩිමනත් කරුනු ආණ්ඩුවේ උප දිසාපතිතුමාට කියාදෙනු පිණිස ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. ඉල්ලුම්කරු හෝ ඔහු වෙනුවෙන් පෙනීසිටීමට ලියවිල්ලකින් බලයලත් අන්කෙනෙක් හෝ ඉඩම් කච්චේරියට නොපැමිණියේනම් ඔහු තම ඉල්ලීම අත්හැර දැමූ හැටියට ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් සලකනවා ඇත.

3. මේ ඉඩම් කොටස් වෙන්කර දෙන්නේ මධ්‍යම පඩික්කීයේ ලාඩිකිකයන්ට පමණකි. මධ්‍යම පඩික්කීයේ ලාඩිකිකයන් හැටියට 1932යේ ආදායම්බදු ආඥාපණතේ ප්‍රකාර 1934යේ මාර්තු මස 31වෙනිදසින් අවසන්වන අවුරුද්දට ගණන් බලනලද නීත්‍යානුකූල ආදායම රුපියල් 6,000කට වැඩිවන්නාවූ කිසිම අයෙක් ඇතුළත් නොවන්නේය. විවාහවූවන් සම්බන්ධයෙන් වූවිට ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේම නීත්‍යානුකූල ආදායම එකතුවූවිට රුපියල් 12,000කට වැඩිවෙතොත් ඒ ස්ත්‍රී හෝ පුරුෂයා මධ්‍යම පඩික්කීයේ ලාඩිකිකයෙකුමෙන් සලකනු නොලැබේ. ඉඩම් වෙන්කරදීම අක්කර 5ටත් 50ටත් අතරේ කට්ටිවලට සීමාකරනු ලැබේ.

4. මේ දැන්වීමේ ප්‍රකාර තෝරාගත් ඉල්ලුම්කරුවන්ට දෙනලද ඉඩම් කට්ටි ඉඩම් සශ්‍රීකකිරීම පිළිබඳ ආඥාපණත වලංගුවනතුරු ඒ ඉඩම්කට්ටි භුක්තිවිඳීම පහත පෙනෙන කොන්දේසි ඇතුළු තවත් එබඳු කොන්දේසි පිට පවත්නා අවසර පත්‍ර පිට වන්නේය.

(i.) අවසරපත්‍රලත් අය විසින් මේ අවසරපත්‍රය පිට තමාට පැවරෙන අයිතිවාසිකම විකිණීම හෝ වෙනයම් අන්දමකින් අන් සතුකිරීම කලින් ඒ සඳහා පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමාගෙන් අවසරයක් ලබාගෙන මිස මොනයම් කරුණක් නිසාවත් නොකට යුතුයි. තවද අවසර ලබානොගෙන කරන එබඳු ඒ කොයියම් විකිණීමක් හෝ අන්සතු පැවරීමක් ඇතහොත් එය වලංගු නොවන්නේය.

(ii.) අවසර පත්‍රයක් පිට ඉඩම දෙන අවස්ථාවේදී ඇති ඉඩමේ වටිනාකමෙන් සියයට තුණකට නොවැඩි මුදලක් අවසරපත්‍රයලත් අය විසින් ආණ්ඩුවට අවුරුදු පතා ගෙවිය යුතුයි.

(iii.) අවසරපත්‍රලත් අය විසින් පළමුවෙනි තුන් අවුරුද්ද තුළ ඉඩමෙන් යටත්පිරිසෙයින් දහයෙන් තුන් කොටසක් වත් එළිකොට වැවිය යුතුයි. ඊළඟ දෑවුරුද්ද තුළ මුළු ඉඩමේ ප්‍රමාණයෙන් යටත්පිරිසෙයින් තවත් හතරෙන් කොටසක්වත් එළිකොට වැවිය යුතුයි. අවසරපත්‍රලත් අය තම අවසරපත්‍රයෙහි නියමිත කාලය තුළ ඉඩමේ නියම ප්‍රමාණයක් එළිකර වැවීමට බැඳුනේද, ඒ ප්‍රමාණයෙහි නොකඩව වැවිලි ගොවිතැන් කරගෙනයායුතුයි.

(iv.) ඉඩමේ තිබෙන ලීදඬු ඉඩමේ මුරපැල් හෝ ගෙවල් තැනීම සඳහා හෝ වැටවල් බැඳීම සඳහා ගැනීමට අවසරලත් අයට බලය තිබේ. එහෙත් පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමාගේ අවසරය නොමැතිව ඉඩමෙන් ලීදඬු කිසිවක් පිට ගෙනයෑමට ඔහුට බලයක් නැත. එකී ආණ්ඩුවේ උප දිසාපතිතුමාට සුදුසුයයි වැටහෙන අන්දමකට ගෙවිල්ලක් ඇතුව හෝ නැතුව ඒ සඳහා වුවමනා අවසරය දියහැකියි.

(v.) අවසරලත් අය අවසරපත්‍රයේ කොන්දේසිවලින් කොයිකක් වුවත් ඉෂ්ට නොකරහැරියොත් හැත්නම් අවසර පත්‍රලත් අයට විරුද්ධව තිබෙන නඩු තීන්දුවක් ඉෂ්ටකිරීම පිණිස එකී ඉඩම හෝ අවසරපත්‍රලත් අයට ඇති අයිතිවාසිකම නඩුනමට ගතහොත් පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමාට අවසරපත්‍රය අවලංගුකොට ඉඩම සහ එහි තිබෙන යම් අස්වැන්නක්, වගාවක්, ගෙයක් හෝ වෙනයම් දියුණුකිරීමක් ඇතහොත් එය තම අත්අඩංගුවට ගතහැක; එපමණක් නොව අවසරපත්‍රලත් අය විසින් හෝ වෙනයම් කෙනෙකු විසින් ඉඩමෙහි කරතිබෙන යම් දියුණුවක් පිළිබඳව තමන්ට සිදුවන පාඩුවක් ගැන කිසියම් ගෙවිල්ලක් ඉල්ලාසිටීමට අවසරපත්‍රලත් අයට හෝ ඔහු වෙනුවෙන් ඉල්ලුම්කරන වෙනයම් කෙනෙකුට හෝ කිසි අයිතිවාසිකමක් නැත.

(vi.) මෙහි දෙනලද ඉඩමෙන් යම් කොටසක් මංමාවත්, ඇළවල් හෝ වෙනයම් කටයුත්තක් සඳහා ආණ්ඩුවට මින්මතු වුවමනා කෙරේනම් අවසරපත්‍රලත් අය විසින් එය ගෙවිල්ලක් නොලබා භාරදිය යුතුයි.

(vii.) අවසරපත්‍රය බලපවත්නා කාලය තුළ අවසරලත් අයගේ මරණය සිදුවුණිනම් ඔහු වෙනුවෙන් පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් අලුත් අවසරපත්‍රයක් අසවලාට නිකුත්කළ යුතුයයි තමා කැමති අයකුගේ නම නියම කිරීමට අවසරපත්‍රලත් අයට බලය තිබේ.

(viii.) අවසරපත්‍රය එය ලත් අයට පුද්ගලිකවූවක් වේ. එය අවසන්වන්නේ ඔහුගේ මරණය සිදුවූවිට වේ.

(ix.) අවසරපත්‍රයෙහි කාලය අවසන්වූවිට ඉඩම නැවතත් රජසන්තක වියයුතුයි. එහි කරතිබෙන කොයියම් දියුණුවක් ගැනවත් වන්දියක් ඉල්ලාසිටීමට කිසිම අයකුට බලයක් නැත.

(x.) අවසරපත්‍ර ලත් අයගේ මරණයෙන් අවසර පත්‍රයේ කාලය අවසන්වූවිට නැසීගිය අවසරලත් අය විසින් නම් කරනලද අය අවසරපත්‍රය ලැබීමට සුදුස්සෙක්යයි තමාට කල්පනාවේනම් ඔහුට හෝ නැසීගිය අවසරපත්‍ර ලත් අයගෙන් යැපෙන්නාවූ කොයියම් අයකුට හෝ එසේත් නැතහොත් වෙනයම් අයෙකුට හෝ අභිමත පරිදි ඒ ඉඩම් සම්බන්ධයෙන් අවසරපත්‍රයක් නිකුත්කිරීමට පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමාට බලය තිබේ.

5. ඉඩම කලින් මැන සුදුසුලෙස කට්ටිවලට කඩානැත්නම් ඉඩම අවසාන වශයෙන් පවරාදීම එය මනිනතුරු කල් දැමීමට පිළිවන.

6. තෝරාගත් ඉල්ලුම්කරුවන් විසින් අක්කරයකට රුපියල් 3 බැගින් මැනුම් ගාස්තු ඉඩම් කච්චේරියෙහිදී තැන්පත් කිරීම අවශ්‍යව්‍ය තැකිය. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමාට උවමනා නැති අමතර මැනීමක් කිරීමට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මැනුම් ගාස්තු ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්ති සහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

වර්ෂ 1935ක්වූ ජනවාරි මස 31වෙනි
දින කොළඹදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් තුමා.

දීමට තිබෙන ඉඩම්වල විස්තර.

| අවසාන සිතියම. | කොටස් අංක. | ගම. | අක්කරයක සාමාන්‍ය මිල. රු. ශ. | දීමට තිබෙන සාමාන්‍ය බිම් ප්‍රමාණය. අ. රූ. ප. | ඉඩම්වල දැමීමට සුදුසුයයි කල්පනා කරනලද වැවිලි. |
|---|---|---|---|---|---|
| 1,837 | 6 | ආඬිගම | 20 0 | 45 3 22 | දෙහි, දොඩම් ආදී පැණිරි වගී සහ පොල් |
| 1,837 | 51 | එම | 25 0 | 92 1 14·6 | |

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L H 913

වැලිකඩ පිහිටි කොච්චියාවත්ත කියන ආණ්ඩුව
සන්තක ඉඩමේ කැබලිවල බද්ද.

කොළඹ වැලිකඩ පිහිටි මෙහි පහත පෙනෙන උප ලේඛනයේ සම්පූර්ණයෙන් සඳහන් කරන තණ ඉඩම් කට්ටි වර්ෂ 1935ක්වූ මාර්තු මස 1වෙනි දින පටන් අවුරුදු 2කුත් මාස 3කට බදු විකිණීම පිණිස මුද්‍ර තබාපු ඉල්ලුම්පත්‍ර හෙවත් ටැන්ඩර් පත්‍ර බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දන්වමි.

2. එකී ඉඩම් කට්ටිවලට එවන ටැන්ඩර්පත්‍ර "කොළඹ වැලිකඩ කොච්චියාවත්තේ බදු ඉල්ලීමේ ටැන්ඩර්පත්‍රයයි" කියා ලියුම් කවරයේ පිට ලියා දමන්ට ඕනෑය. මේ පත්‍ර කොළඹ කච්චේරියේදී වර්ෂ 1935ක්වූ පෙබරවාරි මස 22වෙනි දිනවූ සිකුරාදා දවල් 11 වනතුරු භාරගෙන කඩාබලනවා ඇත. ටැන්ඩර්පත්‍ර ඇරැබ බව ඔප්පුවීමට ටැන්ඩර් ඉදිරිපත් කරන්නාවූ සියළුදෙනාම හෝ ඒ අයවලුන් වෙනුවට ක්‍රියා කරන්ට බලයලත් අයවළුන් ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙනී සිටින්ට ඕනෑය. එසේ කරන්ට නොයෙදුනොත් ඒ ටැන්ඩර් භාර නොගනු ලැබේ.

කොන්දේසි.

1. බද්ද විකුණුම්කළ විගාම ඊට ඇපයක් වශයෙන් දෙම සහ බදු මුදලට වැටෙන මුදලක් කච්චේරියේ බඳින්ට ඕනෑය. ඊට පසු මසකට වැටෙන බදු මුදල මාසයක් පාසා මාසයේ පළමුවෙනි දින ගෙවන්ට ඕනෑය. කොන්දේසියක් කඩකළ විට ඉහතකී ඇප මුදල සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් බදු දීමනාකාරයාට සුදුසුයයි වැටහෙන පරිදි ආණ්ඩුවට හිමිකර දීමේ බලය බදුදීම්නාකාරයා වෙත තබාගන්නවා ඇත. ඉන් ඉතිරි මුදලක් ඇත්නම් එය බදුකාලය අවසානයේදී ගනන් පියවනු ලැබේ.

2. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම අස් කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

3. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිලි පිට කලින් ලබාගත් අවසරයක් නොමැතිව මෙම බද්ද අන් කෙනෙකුට පවරන්ටවත් අන්සන්තක කරන්ටවත් නොහැකිය.

4. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිලි පිට කලින් ලබාගත් අවසරයක් නොමැතිව මෙම ඉඩමෙහි ගෙවල් තැනීමවත් පාරවල් කැපීමවත් නොහැකිය.

5. බදුකාරයා එම ඉඩම පිරිසිදුව සහ සෝභනලෙස තබා ගැනීමද, සෑම අයබදු ගෙවීමද, නාගරික සභාවේ අනපනත්වලට එකඟව ක්‍රියා කිරීමද අවශ්‍යවේ.

6. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිලි පිට කලින් ලබාගත් අවසරයක් නොමැතිව ඉඩමෙහි තණ හැර වෙන කිසි වගාවක් නොකළ යුතුයි.

7. කොළඹ නාගරික සභාවේ ව්‍යවස්ථා රීති අනුව මේ ඉඩමෙහි දැනට තිබෙන කුඩා ගෙවල් හොඳකාර අළුත්වැඩියා කොට තබාගනිමින් ඒවා කුලියටදී මුදල් අයකර ගන්ට බදුකාරයාට අවකාශ තිබේ. ඒජන්ත උන්නාන්සේගෙන් විශේෂ අවසරයක් නොලැබ ගෙවල්කුලී වැඩිකිරීමට අවකාශ නැත. දැනට පවතින ගෙවල් කුලී ලේඛනය කච්චේරියේදී බලාගත හැක.

8. බදුකාරයාට තැපෑලෙන් හෝ අන්කිසි විධියකින් හය මසක් කල්දීමෙන් බද්ද අවසන්කළ හැක. බද්ද අවසන් වන්ට ප්‍රථම මෙම ඉඩම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ආණ්ඩුවට වුවමනාවුවහොත් මාසයක් කලින් දැන්වීමක්කළ විට ඊට අලාභයක්, වන්දියක් නොඉල්ලා එය ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ වූවිට බද්දෙන් එවකට ඉදිරියට ගෙවෙන්ට තිබෙන කාලයට ප්‍රමාණවන බදු මුදල අඩුකර දෙනු ලැබේ.

9. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලකින් කලින් ලබාගත් බලයක් නොමැතිව මෙම ඉඩමෙහි ගවසින් තණ කැවීම තහනම්ය. එසේ බලයක් නොමැතිව ඉඩමෙහි තණකන්ට අරින ගවසින් දඩාවතේ අරින ගවසින් කොට සලකා උන් බැඳීමට බලයලත් අයවළුන් විසින් උන් අල්ලා බඳිනවා ඇත.

10. ඉහතකී මොනම කොන්දේසියක්වත් කඩකළොත් බදුකාරයා සහ ඔහුගේ වැඩකරුවන් අස්කොට ඉඩමේ භුක්තිය නැවත භාරගන්ට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය ඇත.

11. බිම්කැබලි 3ටම එකට හෝ වෙන් වශයෙන් එකකට නොහොත් ඊට වැඩි ගණනකට හෝ ඉල්ලුම්පත්‍ර එවිය හැක.

වැඩි විස්තර වුවමනානම් බස්නාහිර පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කරනු.

අත්සන්කළේ, ආර්. ඇම්. ඇම්. වර්ස්ලි,
බස්නාහිර පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

වර්ෂ 1935ක්වූ පෙබරවාරි මස 8වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඉහතකී උප ලේඛනය.

කොළඹ කුරඳුවත්තේ බදු සිතියමේ අංක 21කේ කොටස්වූ විශේෂ වශයෙන් නො. 20,421 දරණ මුල් සිතියමේ අංක 2, 16, 18, 24, 25, 27 සහ 39 වශයෙන් පෙන්වන අක්කර 7යි රූඩ් 1යි පර්චස් 6ක ප්‍රමාණය ඇති කොළඹ නාගරික සභාවේ පාලනයට අයිත්වූ ඉඩම් කැබලි.

---

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක ඉඩම්වල අවුරුද්දක් තුළ මැණික් හෑරීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. "Tender for the right to gem" එනම් "මැණික් හෑරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්විලෝප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1935ක්වූ පෙබරවාරි මස 28වෙනි දින පෙරවරු 11ත වනතුරු භාර ගනිමින් කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් හිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරවන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම් පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවෙලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා බදු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. ඉල්ලීම භාරගත් දින සිට මාස තුනක් ඇතුළතදී ඉල්ලුම්කාරයා විසින් බදු අවසරපත්‍රයක් ලබානොගත්තොත් නම් ඔහු විසින් ගෙවනලද මුදල රජසන්තක වෙනවා ඇත.

5. බද්ද වලංගු කාලය තුළ බදුදෙන්ට යෙදුන ඉඩමේ ඇති ගස්වලට යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැතිනම් ඉදිරිවැටෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාරනොගැනීමේද, ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

7. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම වැලැක්වීමටත් සබරගමු පළාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බඳින්ට ඕනෑය.

8. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

9. ඉඩම් ඉල්ලුම්කාරයෝ තමතමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල වැඩ පටන්ගන්නා දින සහ වැඩ නවත්වන දිනද කොළඹ ලෝහ පරීක්ෂකතුමා වෙත දන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්ෂකතුමා පතල් විභාගයට ආවිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්ෂාකිරීමට ඉඩදිය යුතුයි.

10. වැඩිදුර කාරණ සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

ඉඩම්වල තොරතුරු.

(1) නවදුන්කෝරලේ ඇස්වැද්දුම පිහිටා තිබෙන නො. 483 දරන සිතියමේ නො. 6 දරන දිගින් දම්වැල් 40ක් පමන ඇති කුඩා පාඩිඹගේ කොටසට මායිම්:—උතුරට: කුඩා පාඩිඹගේ දකුණුඉවුර; නැගෙණහිරට: දෙනිය; දකුණට: කුඩාපාඩිඹයේ වම්ඉවුර; බස්නාහිරට: දියපරගහ සහ මහගල.

(2) කුකුළුකෝරලේ පරගල පිහිටි නො. 224 දරන සිතියමේ නො. 194 දරන බිම්කට්ටිය වන අක්කර 5, රූඩ් 3, පර්චස් 32ක් විශාලකම ඇති ගුරුකඩේහේන නාමැති ඉඩමට මායිම්:—උතුරට: නො. 224 දරන සිතියමේ නො. 198 දරන බිම්කට්ටිය; නැගෙණහිරට: නො. 224 දරන සිතියමේ නො. 194A, 194B, 194C, 194D, දරන බිම්කට්ටි; දකුනට: කැස්බෑදෙල; බස්නාහිරට: පරගලගගේ දකුනුඉවුර.

(3) මැදකෝරලේ මුල්ගම පිහිටි දිගින් දම්වැල් 2ක් පමන ඇති අස්වැද්දුම්දෙල නොහොත් මුල්ගන්ඹයට මායිම්:—උතුරට: මුරුගහතැන්න; නැගෙනහිරට: අස්වැද්දුම්දෙල නොහොත් මුල්ගන්ඹගේ දකුණුඉවුර; දකුණට: අස්සැද්දුමේ කුඹුරේඅමුන; බස්නාඉරට: අස්සැද්දුම්දෙල නොහොත් මුල්ගන්ඹගේ වම්ඉවුර.

(4) කුකුළුකෝරලේ කලවානේ පිහිටි දිගින් දම්වැල් 25ක් පමන ඇති තිනිඹිවිටඇලට මායිම්:—උතුරට: තිනිඹිවිට ඇලේ දකුණුඉවුර; නැගෙනහිරට: 244 දරන සිතියමේ නො. 159යේ කානුව; දකුණට: තිනිඹිවිටඇලේ වම්ඉවුර; බස්නාහිරට: නො. 43 දරන බිම්කට්ටිය වන රත්නක්ගේ වත්ත නැමති ඉඩමේ දකුණු—බස්නාහිර කෙරවලේ සිට නො. 150 දරන බිම්කට්ටියේ ආචාරීගේ උතුරු—බස්නාහිර කෙරවල දක්වා ඇදනැති කෙලින් මායිම (ඉරක්).

(5) කුකුළුකෝරලේ කලවානේ පිහිටි දිගින් දම්වැල් 30ක් පමන ඇති තිනිඹිවිටඇලට මායිම්:—උතුරට: තිනිඹිවිට ඇලේ දකුණුඉවුර; නැගෙනහිරට: පල්ලේවත්තේදෙලත් තිනිඹිවිටඇලත් හාවෙන ස්ථානය; දකුණට: තිනිඹිවිටඇලේ වම්ඉවුර; බස්නාහිරට: 244 සිතියමේ නො. 159යේ කානු වද සහ පෙලෙන්ගගහවෙල.

(6) කුකුළුකෝරලේ දෙල්ගොඩ පිහිටි දිගින් දම්වැල් 3ක් පමන ඇති කොස්වත්තේයට මායිම්:—උතුරට: කැට ලියවල; නැගෙනඉරට කොස්වත්තේයගේ දකුණුඉවුර; දකුණට: ඇල්දෙලත් කොස්වත්තේගයත් හාවෙන ස්ථානය; බස්නාහිරට: කොස්වත්තේගගේ වම්ඉවුර.

(7) කඩවතකෝරලේ රුවනාකන්දේ පිහිටි දිගින් දම්වැල් 2ක් පමන ඇති මැදගස්මූකලානේදෙලට මායිම්:—උතුරට: ගම්සභාපාර; නැගෙනඉරට: මූකලාන සහ මාරකැටියේ හේන; දකුණට: වලවේගඟ; බස්නාඉරට: මැදගයායල සහ මූකලාන.

(8) නවදුන්කෝරලේ කොහොල්ඹිවිටිගම පිහිටි දිගින් දම්වැල් 40ක් පමන ඇති බාදුරුඇලට මායිම්:—උතුරට: 59යේ සිතියමේ නො. 1½ දරන දකුනු මායිමේ කෙලවර සිට දියපාර හාවෙන ස්ථානය සිට කෙලිංඉරක්; නැගෙනඉරට: බාදුරු ඇලේ දකුනුඉවුර; දකුණට: 59යේ සිතියමේ නො. 6 දරන දකුණු මායිමේ දියපාර හාවෙන ස්ථානයේ සිට කෙලින්ඉරක්; බස්නාහිරට: බාදුරුඇලේ වම්ඉවුර.

(9) නවදුන්කෝරලේ පිහිටි දිගින් දම්වැල් 70ක් පමන ඇති බඹරබොටුගඟ සහ කිරිවන්දෙල එක්කාසුවෙනතැන සිට කළුවාඇල එක්කාසුවෙනතැනට මායිම්:—උතුරට: ලොට් නො. 193, 193A, 193B, 100, 192½, 203 සහ 202 නො. 8,632 සිතියමේ; දකුණට: ලොට් නො. 194, 195, 196 සහ 199 නො. 8,632 සිතියමේ; නැගෙනහිරට: කිරිවන් දෙල මූනගැසෙනතැන; බස්නාහිරට: කළුවාඇලමූන ගැසෙනතැන සහ ලොට් නො. 186.

ඇඩ්මන්ඩ් ජේ. කූරේ,
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහ ඒජන්ත
උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1935ක්වූ ජනවාරි මස 30වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

---

පාරක් වැසීම.

කොලොන්නාවේ තෙල් ආගාරය හරහ තිබෙන පුද්ගලික පාර වර්ෂ 1935ක්වූ මාර්තු මස 1වෙනි දින සියළු රථ පදික ගමනාගමනය සඳහා වසා දමනු ලැබේ.

ඒ. ඇන්. සෙව්‍රන්ග්,
වරාය පිළිබඳ සභාවේ සභාපතිතුමා.

කොළඹ, පෙබරවාරි 6, 1935.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.